# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1427 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி

දිනය / Date — 15/11/2023 පැය 0950

# මාධ්‍ය නිවේදනය

## 01. නිවසකට පෙට්‍රල් බෝම්බ ප්‍රහාරයක් එල්ල කල සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් වසම.

2023.11.12 වන දින දෙමටගොඩ පොලිස් වසමේ පිහිටි සංවිධානාත්මක අපරාධ කල්ලි සමාජිකයෙකු වන දෙමටගොඩ රුවන් යන අයගේ නිවසට පෙට්‍රල් බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම සම්බන්ධයෙන් දෙමටගොඩ පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර තිබිණි.

සීසීටීවී දර්ශන ඔස්සේ විමර්ශන සිදුකර අපරාධයට සම්බන්ධ සැකකරුවෙකු 2023.11.14 වන දින දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කුරුඳුවත්ත ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක්වූ දෙමටගොඩ, කොළඹ 09 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙමටගොඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. ධීවර කටයුතු සඳහා පිටව ගිය පුද්ගලයෙකු අතුරුදහන්වීමක් - බේරුවල පොලිස් වසම.

2023.11.13 වන දින රාත්‍රී කාලයේ බේරුවල ධීවර වරායේ සිට මුහුදු සැතපුම් 06 ක් පමණ දුරින් මුහුදේදී පුද්ගලයෙකු අතුරුදහන් වීමක් සම්බන්ධයෙන් බේරුවල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**අතුරුදහන් වූ පුද්ගලයා වයස අවුරුදු 44 ක් වූ මස්සල, බේරුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදහන් වූ පුද්ගලයා සමඟ ධීවරයින් 06 දෙනෙකු 2023.11.13 වන දින බහුදින ධීවර යාත්‍රාවකින් ධීවර කටයුතු සඳහා පිටව ගොස් ඇති අතර අතුරුදහන් වූ පුද්ගලයා රාත්‍රී කාලයේ ධීවර යාත්‍රාවේ ඉදිරි කොටසේ සිට දුරකථනයෙන් කතා කරමින් සිට ඇති අතර මඳ වේලාවකින් ඔහු නිරීක්ෂණය නොවීම හේතුවෙන් අනෙක් පුද්ගලයින්

විසින් යාත්‍රාවේ හිමිකරුට හා බේරුවල නාවික ආරක්ෂක අනු කණ්ඩයට දුරකථනයෙන් දන්වා ඇත.

අතුරුදහන් වූ පුද්ගලයා සොයා නාවික හමුදාව මෙහෙයුම් ආරම්භ කර ඇති අතර යාත්‍රාවේ ගමන් ගත් අනෙක් ධීවරයින් ගොඩබිමට පැමිණ බේරුවල පොලිසියට ප්‍රකාශ ලබා දී ඇත. බේරුවල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - බුලත්සිංහල පොලිස් වසම.

2023.11.14 වන දින උදෑසන කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ බුලත්සිංහල හොරණ මාර්ගයේ ඇගල්ඔය දෙස සිට හොරණ දෙසට ධාවනය කල යතුරු පැදියක් පහල නාරගල ප්‍රදේශයේදී මාර්ගයෙන් ඉවතට පැන අසල තිබූ විදුලි රැහැන් කණුවක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා හොරණ මූලික රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇති අතර පසුපැදිකරු තුවාල ලබා හොරණ මූලික රෝහලේ හදිසි ප්‍රතිකාර අංශයේ ප්‍රතිකාර ලබමින් සිටී.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ දෙල්මැල්ල, බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හොරණ මූලික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**